ඇමුණුම III

**වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීමට බැඳී සිටින අවස්ථාවන්**

| | | |
|---|---|---|
| 01. | පළමු පත්වීම ලැබීමෙන් පසු | පත්වීමෙන් මාස 3ක් ඇතුළත |
| 02. | පත්වීමෙන් අනතුරුව | වාර්ෂිකව |
| 03. | විශ්‍රාම යාම හෝ ධූර කාලය අවසානයේ | දින 14 ක් ඇතුළත |
| 04. | විශ්‍රාම යාමෙන් අනතුරුව | වාර්ෂිකව වසර 2ක් |
| 05. | රුපියල් මිලියන දහයට වැඩි වත්කම් ලබා ගැනීමේදී | මාසයක් ඇතුළත |
| 06. | මැතිවරණ අපේක්ෂකයන් | නාම යෝජනා පත්‍ර සමග |

07. ඉහත 01–06 දක්වා ඇතුළත් නොවන පුද්ගලයන් වෙනත් නීති යටතේ වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමට දක්වා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව

**82 වගන්තිය**

*(1) මේ කොටස අදාළ වන සෑම තැනැත්තකු ම නියෝග මඟින් කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් වත්කම් සහ බැරකම් ප්‍රකාශය—*

*(අ) (මෙහි මින් මතු "පළමු පත්වීම් ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) පත් කළ දින සිට මාස තුනක් තුළ;*

*(ආ) (මෙහි මින් මතු "වාර්ෂික ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) (3) උපවගන්තිය ප්‍රකාරව වාර්ෂිකව;*

*(ඇ) (මෙහි මින් මතු "ධූර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදු කරනු ලබන ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ රැකියාවේ නිල කාලය අවසන් වීමේ දී හෝ ඔහුගේ විශ්‍රාම දිනයෙන් හෝ ඔහු ධූරයෙන් ඉවත් කළ දිනයෙන් ඉක්බිතිවම දින දාහතරක් තුළ;*

*(ඈ) (මෙහි මින් මතු "පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) (ඇ) ඡේදය යටතේ ප්‍රකාශය සිදු කළ වර්ෂයට අනුගාමී වර්ෂ දෙකක් තුළ;*

*(ඉ) (මෙහි මින් මතු "තත්කාර්ය ප්‍රකාශය" යනුවෙන් සඳහන් කරනු ලබන) රුපියල් මිලියන දහයක් හෝ රුපියල් මිලියන දහයකට වඩා වැඩි වත්කම් සහ බැරකම් පිළිබඳ වටිනාකමේ සුවිශේෂී වෙනස්කමක් සිදුවන අවස්ථාවක, ඒ සිදුවීමේ දින සිට මාසයක් ඇතුළත; සහ*

*(ඊ) අවස්ථාවෝචිත පරිදි, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හෝ (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ, මැතිවරණ සඳහා නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇති විට දී, සිදු කළ යුතු ය.*

*(2)* යම් තැනැත්තකු නියම කළ දිනයේ දී මේ කොටස අදාළ නොවන තැනැත්තකු වන අවස්ථාවක දී, මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වන දින සිට මාස තුනක් ඇතුළත ඔහු විසින් මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වන දිනට ඔහුගේ වත්කම් හා බැරකම් ප්‍රකාශයක් සිදු කළ යුතු ය:

*එසේ වුව ද, 80 වගන්තියේ (1) උපවගන්තියේ (ප) ඡේදයේ සඳහන් පරිදි, මේ කොටස අදාළ වන යම් තැනැත්තකු විසින්, ඡන්ද විමසීම පිළිබඳ දිනය ප්‍රකාශ කරනු ලබන අදාළ නීතිය යටතේ, ප්‍රකාශය සිදු කරනු ලබන දිනය දක්වා වන කාලසීමාව සඳහා ඔහුගේ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු ය.*

*(3) (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ වත්කම් සහ බැරකම්වල පළමු ප්‍රකාශය භාරදීමට නියම කර ඇති සෑම තැනැත්තකු ම, මේ කොටස අදාළ වන තැනැත්තකු බවට ඔහු පත්වීම අවසන් වී ඇත්නම් මිස එක් එක් වර්ෂයේ ජූනි මස තිස්වන දින වන විට ඒ වර්ෂයේ මාර්තු මස තිස් එක් වන දිනට ඔහුගේ වත්කම් සහ බැරකම්වල ප්‍රකාශයක් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සිදු කළ යුතු අතර, මේ කොටස යටතේ ඔහුගේ වත්කම් සහ බැරකම්වල ප්‍රකාශයක් සිදු කිරීමට පළමුව ඔහුට නියම කළ දිනයේ ඔහු විසින් දැරූ වත්කම් සහ බැරකම් ඒ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු ය:*

*එසේ වුව ද, (2) වන උපවගන්තිය යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයක් සිදු කිරීමට නියම කර ඇති තැනැත්තකු විසින් යම් වර්ෂයක් තුළ මාර්තු මස තිස්එක් වන දිනයට පෙරාතුව මාස හයක් තුළ යම් දිනයක දී පළමු ප්‍රකාශය සිදු කර ඇති අවස්ථාවක දී, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් කරන ලද සුවිශේෂී වෙනසක් ඔහුගේ වත්කම් සහ බැරකම්වල පවතින අවස්ථාවක ඒ සඳහා වන තත්කාර්ය ප්‍රකාශයක් හැර වෙනත් ප්‍රකාශයක් ඒ වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලෙසට ඔහුට නියම නොකළ යුතු ය.*